ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
Department of Census and Statistics

මගේ අංකය
எனது இல.
My Number 02/QSIP/2023

ඔබේ අංකය
உமது இல.
Your Number

දිනය
திகதி
Date 2023.10.12

සියලුම දිස්ත්‍රික් අංශ ප්‍රධානී,

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය ,

**<u>කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය - 2023 තෙවන කාර්තුව</u>**

වර්තමානයේ රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ඉහත සමීක්ෂණය සඳහා දත්ත ලබා ගැනීම බහුවිධ ක්‍රමවේදයන් ඔස්සේ සිදු කිරීමටත් මෙම සමීක්ෂණ නව ක්‍රමවේද ඔස්සේ සංවිධානය කිරීමටත් මෙම සමීක්ෂණයට අදාළ කාර්ය සාධන රැස්වීම් වලදී මෙන්ම අංශ අතර පැවති සාකච්ඡා වලදී තීරණය කරන ලදී. මෙම ක්‍රම වේදය මගින් වර්තමානයේ රට තුළ පවතින වසංගත තත්වය හේතු කොට ගෙන ඇති විය හැකි ප්‍රමාදයන් වලක්වා ගනිමින් සමීක්ෂණයේ ඉදිරි කටයුතු සාර්ථකව සිදු කළ හැකි බව මාගේ අපේක්ෂාවයි.

02) ඒ අනුව මෙම සමීක්ෂණයට අදාල වන ලේඛන මේ වන විට අප දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුළ ප්‍රකාශයට පත් කර ඇත. (මේ වන විට මේ සම්බන්ධව E mail පණිවිඩයක් ඔබ අංශයට එවා ඇත ) ඒ අතර ආයතන වෙත යොමු කිරීමට අදාළ වන අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සන සහිත සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කළ ආවරණ ලිපි, දෘඩ පිටපත් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයෙන් සකස් කළ ප්‍රශ්නාවලි හා ආයතන වෙත E mail කිරීම සඳහා සකස් කළ ප්‍රශ්නාවලිය (Excel format) වේ. ඒ අනුව ඔබගේ අවශ්‍යතාව පරිදි අදාළ ලිපි බාගත කර දෘඩ හෝ මෘදු පිටපත් ආයතන වෙත යොමු කොට සමීක්ෂණයට අදාළ තොරතුරු ලබා ගැනීමේ කටයුතු දිස්ත්‍රික් කාර්යාල මගින් සම්බන්ධීකරණය කළ යුතු වේ.

03) ඉහත සමීක්ෂණයට අදාළව 2023 තෙවන කාර්තුවට අදාළ දත්ත ලබාගැනීමට අදාළ වන ප්‍රා.ලේ. කොට්ඨාසය සඳහා වූ කර්මාන්ත ආයතන රාමුව හා දිස්ත්‍රික්කය භාර නිලධාරියා විසින් දිස්ත්‍රික්කය වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අධීක්ෂණ වාර්තාවෙහි ආකෘති පත්‍ර (QSS-1) මේ වන විට දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය වෙත E mail කර ඇත.

04) 2023 තෙවන කාර්තුවේ තොරතුරු සියලුම ආයතන වෙතින් 2023 සැප්තැම්බර් මස අවසන් වූ විගස ලබා ගෙන 2023/11/13 දිනට පෙර උපලේඛනවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමෙන් පසු, ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කඩිනමින් දෙවන අංශය වෙත එවිය යුතු වේ.

පී.එම්.පී.අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල්



CamScanner